# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/64 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x)(ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1)(ආ) වගන්තිය සමග කියවිය යුතු 25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1)(ආ) වගන්තිය සමග කියවිය යුතු 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද, අංක 30ඒ. මලලසේකර මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2022 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 2302/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන හා II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ : -

**I වන උපලේඛනය**

**කොන්දේසි**

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී (SLQF 9 වන මට්ටම) රාජ්‍ය මූල්‍ය කළමනාකරණපති උපාධිය සම්බන්ධයෙන් -

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හෝ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන, අධ්‍යයන සම්භාර 30ක් සහිත ගිණුම්කරණය හෝ මූල්‍ය යන විෂය ධාරාව යටතේ මූලික උපාධියක් ලබා තිබීම;

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, රජයේ විගණන සේවය හෝ දේශීය ආදායම් හා සම්බන්ධ යම් සේවයක කවර හෝ තලයක නිලධරයකු ව, පිළිගත් මූලික උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම;

1A - PG 6243 — 286 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන වෙනත් රජයේ ආයතනයක සේවයේ නියුතු මූල්‍ය කළමනාකාරවරයකු, ගණකාධිකාරිවරයකු හෝ ඒ හා සමාන මට්ටමේ තනතුරක් දරන තැනැත්තකුව, ආදාළ ක්ෂේත්‍රයේ පිළිගත් මූලික උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම;

(ඈ) වෙනත් රාජ්‍ය සේවා නියුක්තිකයෙකු වන විට, ගණකාධිකරණය හෝ මූල්‍ය හෝ වෙනත් යම් අදාළ විෂයකින් ලබාගත් පිළිගත් මූලික උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (3) පළපුරුද්ද සහිත තැනැත්තකු වීම;

(ඉ) මේ පාඨමාලාව හැදෑරීමට උනන්දුවක් දක්වන, පිළිගත් මූලික උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සහිත හා එම සුදුසුකම් ලැබීමෙන් අනතුරුව වසර තුනක (3) අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද සහිත තැනැත්තකු වීම; හෝ

(ඊ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ (ICASL) අධ්‍යයන අධිකාරිය විසින් තීරණය කරනු ලබන, (1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද) ශ්‍රී ලංකා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන, අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) (SLQF 07වන මට්ටම) සම්පූර්ණ කර තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. මේ නියමයේ කාර්යය සඳහා, පහත සඳහන් සුදුසුකම් අදාළ වෘත්තීය සුදුසුකම් ලෙස පිළිගනු ලැබේ :-

(අ) ගණකාධිකරණය පිළිබඳ සිව් (4) අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (HNDA);

(ආ) ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව

(ඇ) වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA), වරලත් ගණකාධිකාරී (CA), වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය (CIMA), වරලත් සහතිකලාභී ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) හෝ වරලත් හිමියන් (Charter Holders).

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (ICASL) පිළිගනු ලැබේ.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණපති උපාධිය | එම්පීඑෆ්එම් |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0013